### ඉතිහාසයෙන් බිඳක්

# කළ කම් විඳි රජ බිසව කුවණ්ණා

**විජය** මේ රටේ පළමු රජ තුමන් වූ අතර, අපේ ඉතිහාසයේ පටන් ගැන්ම සිදුවන්නේ ඔහුගෙනි. විජය සිංහල ජාතියේ ආරම්භකයා ලෙසද සැලකේ. විජය රජුගේ පළමු බිසව වූයේ කුවණ්ණා හෙවත් කුවේණියයි. කුවණ්ණා යක්ෂ ගෝත්‍රයට අයත් කෙනෙකි. විජය

සුසිල් පීරිස්

කුමරුන් හා සිදුකළ මුල් හමුවේදී ඇති කරගත් යම් යම් එකඟතා නිසා ඇය විජය රජුගේ බිසව වූවාය.

සමහර තොරතුරු, යක්ෂ ගෝත්‍රිකයින් අමනුස්ස කොටසක් ලෙස දක්වයි. විජය කුමරු මෙහි පැමිණ කුවේණිය හා මිත්‍රවී, ඇගේ සහායෙන් රටේ පාලනය ද ලබා, ඇය තම බිසව බවටද පත්කර ගත්තේය. මේ සිද්ධියෙන් පැහැදිළි වන්නේ යක්ෂ යනු එක්තරා මිනිස් ගෝත්‍රයක්ම බවය. විජය කුවණ්ණා එකතුවත් සමඟ, ඔහු හා සිටි අනෙක් අයද නිතැතින්ම දේශීය කතුන් හා එක් වන්නට ඇති බව නිසැකය. මනුස්ස අමනුස්ස පිරිස් අඹුසැමියන් ලෙස එක්වීම සිරිත නොවේ.

එකල ලංකාව හැඳින්වූනේ තම්බපණ්ණී ලෙසිනි. මෙහි අත්න හෙවත් මැණික් බහුල වූ හෙයින්, මෙය රත්න දීප නමින් ද හැඳින්විය. සිංහ, හෙවත් සිංහල නම් වූ කෙනෙකුගෙන් විජය පැවත එන නිසා, ඔහු හා ඔහු සමඟ ආ පිරිස සිංහලයින් ලෙස ගැනේ. සිංහලයින් පදිංචි දිවයින සිංහල දීප නම් විය.

නිල වශයෙන් සිදුවූ ආර්ය පැමිණීම විජයගේ පැමිණීම වූවද, විජය පැමිණීමට පෙරත් ආර්ය පිරිස් මෙහි පැමිණියහ. එය කීප අවස්ථාවක සිදුව ඇති බවට සාධක ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයේ මෙහි ජීවත් වූ යක්ෂ, නාග හා රක්ෂස නම් ජන කොටස් ගැන, මහාවංශයේද සඳහන් වේ. ඔවුන් සිහිගන්වන ග්‍රාමනාම අදටත් ව්‍යවහාරයේ පවතී. යක්දෙස්සාව, යක්කඩුව, යකා බැඳි ඇල්ල, යක්කල, නාගදීප, නාගොඩ, නයාපාමුල, නයිවල, හා ඔටුන්න, නාවිමන, රාස්පාගල, රාස්සපාන ඉන් කීපයකි. මීට අවුරුදු පන් දහසකට පමණ පෙර, මෙරට ජීවත් වූ ඉතා දියුණු සංස්කෘතියකට අයත් රාවණා යුගයක් ගැන තොරතුරු කියන ප්‍රබල ජනප්‍රවාද, අප අතර පවතී. සිංහලයා රාවණාගෙන් පැවත එන්නන් බව ඒ



ජනප්‍රවාද විශ්වාස කරන අය කියති. මේ කථා වලට සම්බන්ධ ග්‍රාම නාමද, ව්‍යවහාරයේ පවතින්නේය. රාවණා ඇල්ල, සීතා එළිය, සීතාවක ඒවායින් කීපයකි. ලංකාවේ පැරණි රාජධානියක් වන කල්‍යාණිය හෙවත් කැළණිය, ප්‍රාග් ඓතිහාසික යුගයේදී පාලනය කළ විභීෂණ නම් රජෙකු ගැන ද ජනප්‍රවාදයක සඳහන්වේ. විභීෂණ සිය සොහොයුරු රාවණාට විරුද්ධව, විදේශික රාමගේ පැත්ත ගත් නිසා, රාවණා පරාජයට පත්වූ බවද එම කථා පුවත සඳහන් කරන්නේය. තම රට මුලින්ම විදේශිකයෙකුට පාවා දුන් පුද්ගලයා විභීෂණ බව, එම වෘත්තාන්තයෙන් ගම්‍ය වන්නේය. මේ කථාව සැබෑනම්, කුවණ්ණාද පැවත එන්නේ රාවණා ගෙනි. එසේ වූවහොත් රට පාවා දීමේ බරපතල වරදට ඇයද අසු වන්නීය. ඇය රට පාවා දුන්නේ විජය නම් විදේශිකයාටය. බුදුන් වහන්සේ ජීවමානව වැඩ සිටියදී, වරක් යක්ෂ ගෝත්‍රිකයින් උදෙසාත්, තව වරක් නාගයින් උදෙසාත්, මෙහි වැඩම කළ බව බෞද්ධ කථාවල සඳහන්ය. මේ අනුවද යක්ෂ හා නාග ගෝත්‍රික පිරිස්, මෙහි ජීවත්ව සිටි බව පෙනේ. ක්‍රි. පූ 6 වන සියවසේදී විජය මෙහි එන විට, වංශ කථා කියන පරිදි මෙහි වූයේ කුවේණිය හා ඇගේ පිරිස්ය. එකල ඇය රටේ ප්‍රධාන චරිතය වූ බව පෙනේ. විජය හා පිරිස මුණ ගැසීම, කථා බහ කිරීම, සන්ධාන ගතවීම ආදි සියල්ල සිදු වූයේ ඇගේ මූලිකත්වයෙනි. විජය කුමරුන් ගැන පිළිබඳ සිත් ඇති කර ගත් ඇය, ඔහුට රට භාරදීමට සූදානම් වූවාය. ඇය ඉන් නොනැවතී ඇයට විරුද්ධ අය මරා දැම්මාය.

මේ වන විටත් ආර්ය පිරිස් මෙහි සිටියා නම්, ඒ අයත් ගන්නට ඇත්තේ විජය පාර්ශවයයි. මෙයද විජයට වාසි වූවාට සැක නැත. රට පිළිබඳව කුවේණිය ගත් ක්‍රියා මාර්ගය සියලු ප්‍රධානීන් අනුමත කළේ නැත. මින් වසර 100 කට පසුවත් පණ්ඩුකාභය රාජ්‍යයක් ගොඩ නගා ගත්තේ, දරුණු සටන් වලින් දේශීය නායකයින් පරාජය කිරීමෙන් පසුවය. ඔහුට රාජ්‍යය පවත්වාගෙන යාමට පවා දේශීය නායකයින් සතුටු කිරීමට සිදුවිය.

අවසානයේදී කුවේණියට අත්වන්නේ ඉතාම සෝචනීය ඉරණමකි. ජනතාවගේ රට, තම සිතැඟි පරිදි අනුන්ට පාවා දිමට ගිය පාපය, ඇගේ හිස මත කඩා වැටේ. විජයට කුවේණිය එපාවී අභිෂේකය සඳහා රාජ කන්‍යාවක්ම ඔනෑ වේ. ආරාවුල උත්සන්න වී, විජය අතින් පන්නා දැමෙන කුවේණිය, කාත්කවුරුත් නැතිව අසරණව, සිය දරු දෙදෙනාද රැ ගෙන වනගත වන්නීය.

වන ගතව වාසය කළ ඒ දරු දෙදෙනාගෙන් පුලින්ද හෙවත් වැද්දන් පැවත එන බව කියැවේ. කුවේණිය ලද අවාසනාවන්ත ඉරණම කෙරෙහි දේශීය කිසිවෙක් දොම්නස් වූ බවක් නොකියැවේ. උපන් රට ගැන ඇය අනුගමනය කළ ක්‍රියා පිළිවෙළ පිළිබඳව, බොහෝ අය සිටියේ ඇය කෙරෙහි විරසකවය. ඉන් පසු අපට අසන්නට ලැබෙන්නේ විජයට දෙස් දෙවොල් තබමින් ශාප කරමින්, දිවයිනේ තැන තැන ඇවිද යන විකාරරූපී කුවේණියක් ගැනය.

වයඹ පළාතේ කුරුණෑගල නගරාසන්න පර්වත ජාලයේ එක් වැදගත් පර්වතයක්, කුවේණියගේ වැළපීම් මාලාවේ මර්මස්ථානයක් බවට පත්විය.

මුහුදු මට්ටමේ සිට අඩි 1700 ක් තරම් උස, මේ ගල් පර්වතය පර්වත අතර දැවැන්තයෙකි. ගස් කොළන් සහිත ඉහළට නැගී ගිය ගිරි ශිඛරය නිසා, මෙය අනෙක් සියල්ලෙන් වෙන්ව කැපී පෙනේ. ජීවිතාන්තය දක්වාම විජය රජුට ශාප කරමින්, දෙස් දෙවොල් තබමින්, ඇය ඒ පර්වතය ඉදිරියේ හඬා වැටුනාය.

යකින්නක් වූ කුවණ්ණා දෙස් තැබූ ගල, අදත් යද්දෙස්සා ගල නමින් කුරුණෑගල පුරයේ ප්‍රකටව පවතී. කුවණ්ණාගේ ශාපයෙන් විජය රජුට ගැලවෙන්නට බැරිවිය. රජ වුණත්, ඔහුට පරපුර ගෙන යන්නට, පුතෙකු නැතිවිය. ඒ කුවේණියගේ ශාපය නිසා බව කියයි.

ඔහුගෙන් පසුව සිහසුනට පත් පඩුවස්දෙව් රජුට වැළඳුන දිවි දොසින්, ඔහු බොහෝ දුක් වින්ද බව කියති. ඔහුගේ පුතුන් දස දෙනාගෙන් නව දෙනෙක්ම, සිය බෑණනුවන් වූ පණ්ඩුකාභය කුමරුගෙන් මැරුම් කෑවෝය. ඉන් පසු රට ජාතියට සහනයක් ලැබෙන්නේ මහින්දාගමනයත් සමඟ බුදු දහම ලැබීමෙන් පසු යයි කියති.

